සැ. යු. - මෙම ගැසට් පත්‍රය දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් වෙන වෙනම පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1134/5 - 2000 මැයි 30 වැනි අඟහරුවාද - 2000.05.30

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය

I A - H 007481 - 405 (2000/05)

### ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, 1988 ජූනි මස 06 වැනි දිනැති අංක 509/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ව්‍යවස්ථා සංග්‍රහයෙන් හා 1991 ඔක්තෝම්බර් මස 11 වැනි දිනැති අංක 683/16 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ව්‍යවස්ථා සංග්‍රහයෙන් සංශෝධිත හා 1994 සැප්තැම්බර් මස 16 වැනි දිනැති අංක 836/26 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ව්‍යවස්ථා සංග්‍රහයෙන් සංශෝධිත හා 1998 ජූනි 04 දිනැති අංක 1030/23 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ව්‍යවස්ථා සංග්‍රහයෙන් සංශෝධිත 1985 අප්‍රේල් මස 19 දිනැති අංක 345/40 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ව්‍යවස්ථා සංග්‍රහය වෙනුවට පහත දැක්වෙන ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය පළකරනු ලැබේ.

කොඩිතුවක්කු ජ්. ආනන්ද
ලේකම්
ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවා මණ්ඩලය.

වසර 2000 අප්‍රියෙල් මස. 28, වැනි දින
ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවා මණ්ඩලය,
සැලසුම් ක්‍රියාත්මක කිරීම හා පාර්ලිමේන්තු
කටයුතු අමාත්‍යාංශය,
3 වන මහල, සෙත්සිරිපාය
බත්තරමුල්ල.

### ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය

1. 1985 අප්‍රේල් මස 19 වැනි දින අංක 345/40 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූ ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ විධි විධානයන් යටතේ ගන්නා ලද හෝ එය යටතේ ගත් ලෙස අදහස් කරන ලද හෝ කිසියම් පියවරකට හානියක් නොවන පරිදි මෙම ව්‍යවස්ථා සංග්‍රහය 1985 ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වනු ඇත.

2. නියමිත දිනය

2.1 මෙම ව්‍යවස්ථා සංග්‍රහයෙහි 'නියමිත දිනය' යනුවෙන් අදහස් කෙරෙනුයේ 1984 දෙසැම්බර් මස 31 වැනි දිනයයි.

3. සේවයේ ව්‍යුහය

ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය එම සේවයෙහි පහත නම්කර ඇති ඕනෑම පංතියකට හො ශ්‍රේණියකට පත් කරන ලද රාජ්‍ය නිලධාරීන්ගෙන් සමන්විත වනු ඇත.

3.1 වැටුප් පරිමාණය - වාර්ෂික
I වැනි පංතිය : රු. 179,520-10x8,160- රු. 261,120
II වැනි පංතිය -
I වැනි ශ්‍රේණිය : රු.138,540-7x5,520- රු.177,180
II වැනි පංතිය -
II වැනි ශ්‍රේණිය : රු.97,500-15x2,700- රු 138,000
(රු. 102,900 ට පෙර 1 වැනි කාර්යක්ෂමතා කඩඉම සහ රු. 119,100 ට පෙර 2 වැනි කාර්යක්ෂමතා කඩ ඉම.)

3.2 ක්‍රම සම්පාදන සේවයේ ආරම්භක සේවක සංඛ්‍යාව වශයෙන් සලකනු ලබන්නේ පහත 9 වන ඡේදයේ විධිවිධාන යටතේ 1985 ජනවාරි මස 01 වැනි දින ක්‍රම සම්පාදන සේවයේ I වන පංතියට II වන පංතියේ I වන ශ්‍රේණියට සහ II වන පංතියේ II වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබූ නිලධාරීන් සංඛ්‍යාවට සමාන තනතුරු සංඛ්‍යාවකි.

3.3 රජයේ අවශ්‍යතාවන්ට අනුව ක්‍රම සම්පාදන සේවයේ සේවක සංඛ්‍යාව කලින් කලට වෙනස් විය හැකිය.

3.4 ඕනෑම පංතියක හෝ ශ්‍රේණියක හෝ සේවක සංඛ්‍යාවෙහි සහ ඊට ඉහළ පංතිවල හෝ ශ්‍රේණිවල හෝ සේවක සංඛ්‍යාවෙහි එකතුව එකට ගත්කල එම එකතුව කිසිම අවස්ථාවකදී ඉක්ම නොයන පරිදි ඕනෑම පංතියක් හෝ ශ්‍රේණියක් සඳහා අනුමත සේවක සංඛ්‍යාවකට වැඩි නිලධාරී පිරිසක් එම පංතියේ හෝ ශ්‍රේණියේ සිටිය හැක.

4. ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවා මංඩලය.

4.1 රාජ්‍ය පරිපාලන විෂය භාර ඇමතිතුමා විසින් පත් කරනු ලබන සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත (මෙහි මින් මතු 'මණ්ඩලය' යනුවෙන් හඳුන්වනු ලබන) ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවා මණ්ඩලයක් වන්නේය. මණ්ඩලයේ සාමාජිකයන් පස් දෙනා පහත සඳහන් අය වන්නාහ.

I. ජාතික ක්‍රම සම්පාදන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් - ඔහු මණ්ඩලයේ සභාපති වන්නේය.
II. මුදල් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්.
III. රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්.
IV. සැලසුම් ක්‍රියාත්මක කිරීමේ විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්.
V. ජාතික ක්‍රම සම්පාදන විෂය භාර ඇමතිතුමා විසින් මුදල් විෂය භාර ඇමතිතුමා සමග අදහස් සාකච්ඡා කොට නම් කල යුතු වන ප්‍රවීන අර්ථ ශාස්ත්‍රඥයෙකු. ඔහු රාජ්‍ය සේවයේ නිලධාරියෙකු වන්නේ නම් ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ නිලධාරියෙකු නොවිය යුත්තේය.

4.2 ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය, මණ්ඩලයේ සාමාන්‍ය පාලනය යටතේ පවතිනු ඇත. ක්‍රම සම්පාදන සේවයේ නිලධාරීන්ගේ කලමණාකරණය, පුහුණු කිරීම හා සේවා නියුක්තිය මණ්ඩලයේ වගකීම වන්නේය.

4.3 මණ්ඩලයට ලේකම් වරයෙක් වන්නේය. ඔහු ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු විය යුතු අතර මණ්ඩලය විසින් පත් කරනු ලබිය යුතුය.

5. ස්ථාන මාරුකිරීම්.

5.1 ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ නිලධාරිනු ස්ථාන මාරුවීම් සහිත සේවයකට අයත් වන අතර, දිවයිනේ ඕනෑම ප්‍රදේශයකට ඔවුන් පත්කර යැවිය හැකි වන්නේය. අමාත්‍යාංශ අතර ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ නිලධාරීන් මාරු කිරීම මණ්ඩලයේ සභාපති විසින් කරනු ලබනු ඇත. එසේ වුවද, සේවයේ I වන පංතියේ නිලධාරීන් සම්බන්ධ මාරුකිරීම් සඳහා මණ්ඩලයේ සභාපති විසින් මණ්ඩලයේ අනුමැතිය ලබාගනු ඇත.

5.2 අමාත්‍යාංශ ඇතුලත ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ නිලධාරීන් මාරු කිරීම් අදාල අමාත්‍යාංශයේ ලේකම් විසින් කරනු ලබනු ඇත.

6. පත් කිරීම්

6.1 ජාතික ක්‍රම සම්පාදන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්ගෙන් සහ රාජ්‍ය සේවයේ තවත් නිලධාරීන් හතර දෙනෙකුට නොවැඩි ගණනකින් සමන්විත වන මණ්ඩලයක් විසින් පත් කරනු ලබන කමිටුවක නිර්දේශය ලබා ගැනිමෙන් පසුව ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ I වැනි පංතියට මණ්ඩලය විසින් පත්වීම් කරනු ලබනු ඇත.

6.1.1 I වන පංතියේ ඇබෑර්තු සාමාන්‍ය වශයෙන් පුරවනු ලබන්නේ II වන පංතියේ I වන ශ්‍රේණියේ නිලධාරීන් උසස් කිරීමෙනි. මේ සඳහා II වන පංතියේ I වන ශ්‍රේණියේ නිලධාරීන්ට II වන පංතියේ I වන ශ්‍රේණියේ අවුරුදු පහක සේවා කාලයක් තිබීම හෝ ක්‍රම සම්පාදන සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබීමට සුදුසුකම් ලැබීම සඳහ නියමිත දිනයේදී දැරිය යුතුව තිබූ ඕනෑම තනතුරක අවුරුදු පහළොවක සේවා එකතුවක් තිබිය යුතු අතර, අවම වශයෙන් ඉන් අවුරුදු දෙකක් II වන පංතියේ I ශ්‍රේණියේ සේවයක් විය යුතුය.

6.1.2 9 වන ජේදයේ විධිවිධාන යටතේ 1985 ජනවාරි 01 වැනි දින II වන පංතියේ I වන ශ්‍රේණියට අතතර්ග්‍රහණය කරන ලද නිලධාරියෙකු සම්බන්ධයෙන්වූ විට රුපියල් 55,200-7x2,400-72,000 වැටුප් ක්‍රමයට ගැනෙන, නියමිත දිනට වූ ඔහුගේ සේවා කාලය මේ සඳහා II වන පංතියේ I වන ශ්‍රේණියේ සේවයක් වශයෙන් ගණන් ගනු ලැබේ.

6.2 මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ II වන පන්තියේ I වන ශ්‍රේණියට පත්වීම් කරනු ලැබේ.

6.2.1 II වන පන්තියේ I වන ශ්‍රේණියේ ඇබෑර්තු සාමාන්‍ය වශයෙන් පුරවනු ලබන්නේ II වන පංතියේ II වන ශ්‍රේණියේ නිලධාරීන් උසස් කිරීමෙනි. මේ සඳහා (I) II වන පන්තියේ II වන ශ්‍රේණියේ නිලධාරීන්ට II වන පන්තියේ II වන ශ්‍රේණියේ හෝ II පංතියේ II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබීම සඳහා නියමිත දිනයේදී දැරිය යුතුව තිබුණ තනතුරක හෝ අවම වශයෙන් අවුරුදු දහයක සතුටුදායක අඛණ්ඩ සේවා කාලයක් තිබිය යුතුය.
(II) 8:2:1 හා 8:2:2 ජේදයන්හි දක්වා ඇති කාර්යක්ෂමතා කඩඉම් සමත් වී හෝ ඒවායින් නිදහස් කර තිබිය යුතුය.
(III) දෙවන භාෂාව සමත් වී හෝ එයින් නිදහස් කරනු ලැබ සිටිය යුතුය.

6.2.2 9 වන ජේදයේ විධිවිධාන යටතේ II වන පන්තියේ II වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන ලද නිලධාරියෙකු සම්බන්ධයෙන් වූ විට රුපියල් 36,000-15x1,200-54,000 වැටුප් ක්‍රමයේ හෝ රුපියල් 40,800-11x1,200-54,000 වැටුප් ක්‍රමයේ හෝ නියමිත දිනට සපුරා ඇති ඔහුගේ සේවා කාලය මේ සඳහා II වන පන්තියේ II වන ශ්‍රේණියේ සේවයන් වශයෙන් ගණන් ගනු ලැබේ.

6.3 8:2:1 සහ 8:2:2 ජේදයන්හි විධිවිධාන යටතේ වර්ෂයකට රුපියල් 102,900 කට සහ රුපියල් 119,100 කට පෙර ඇති කාර්යක්ෂමතා කඩඉම් වලින් ඔබ්බට උසස් කිරීම සඳහා නියමිත පරීක්ෂණයන් ගෙන් නිදහස් කරනු ලැබ සිටින නිලධාරියෙකු 6:2:1 ජේදයේ කාර්යයන් සඳහා ද, කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණවලින් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

6.4. විවෘත තරඟ විභාගය

6.4.1 ක්‍රම සම්පාදන සේවයේ II වන පන්තියේ II වන ශ්‍රේණියේ ඇබෑර්තු වලින් සියයට හැත්තෑ පහකට (75%) නොවැඩි ඇබෑර්තු සංඛ්‍යාවක් සඳහා පත්වීම් දෙනු ලබන්නේ විවෘත තරඟ විභාගයක ප්‍රතිඵල මත අංක 15/90 හා 1990.03.09 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ හා ඊට අදාළ සංශෝධනයන්හි විධිවිධානයන්ට යටත්ව මණ්ඩලය විසින්ය. මෙම විභාගය මණ්ඩලය වෙනුවෙන් විභාග කොමසාරිස් විසින් පවත්වනු ලැබේ. මෙම විභාගයේ විස්තර 'අ' පරිශිෂ්ඨයේ ඇත.

6.4.2 (I) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් I වන පන්තියේ හෝ II වන පන්තියේ හෝ ගෞරව උපාධියක් නැතහොත් (II) පිළිගත් විශ්ව විද්‍යාලයකින් පශ්චාත් උපාධියක් ලබා ඇති හෝ (III) පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සහිතව පිළිගත් විශ්ව

විද්‍යාලයකින් උපාධියක් ලබා ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන අපේක්ෂකයෝ විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබන්නාහ.

6.4.3 මණ්ඩලය විසින් එක් එක් විභාගය සම්බන්ධයෙන් නියමනය කරනු ලබන දිනයකට තමා වයස අවුරුදු 22 කට එළඹ සිටින බවට හා වයස අවුරුදු 36 ට එළඹ නැති බවටද චරිතය සම්බන්ධයෙන් තමා නිසි ලෙස සුදුසු බවට ද සතුටුදායක සාක්ෂි හැම අපේක්ෂකයකු විසින්ම ඉදිරිපත් කළ යුතුය. (විවෘත තරඟ විභාගයට තුන් වතාවකට වඩා පෙනී සිටීමට කිසිම අපේක්ෂකයෙකුට හිමිකම් නැත.)

6.4.4 සෑම අපේක්ෂකයෙකුම මනා පෞරුෂත්වයකින් යුතුව, හොඳ ඇස් පෙනීමකින් හා සේවය සඳහා අන් සෑම අයුරින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතු අතර, මෙම කරුණු පරීක්ෂා කිරීම සඳහා වෛද්‍ය පරීක්ෂණයට පෙනී සිටීමට ඔහුට නියම කෙරෙනු ඇත.

6.4.5 විභාගයට අයදුම් කළයුතු ආකාරය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මගින් දැනුම් දෙනු ලැබේ.

6.4.6 විභාගය සඳහා අපේක්ෂකයෙකු විසින් ගෙවිය යුතු වන ගාස්තු ප්‍රමාණය අයදුම්පත් කැඳවන නිවේදනයේ සඳහන් කරනු ලබනු ඇත.

6.5 සීමිත තරඟ විභාගය

6.5.1 ක්‍රම සම්පාදන සේවයේ II වන පන්තියේ II වන ශ්‍රේණියේ ඇබෑර්තු වලින් සියයට විසිපහකට (25%) නොවැඩි ඇබෑර්තු සංඛ්‍යාවක් සඳහා සීමිත තරඟ විභාගයක ප්‍රතිඵල මත මණ්ඩලය විසින් පත්වීම් දෙනු ලබයි. මෙම විභාගය මණ්ඩලය වෙනුවෙන් විභාග කොමසාරිස් විසින් පවත්වනු ලැබේ. මෙම විභාගය පිළිබඳ විස්තර මෙහි 'ආ' පරිශිෂ්ඨයේ ඇත. ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය ක්‍රියාත්මකව පවත්නා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ක්‍රම සම්පාදන කටයුතුවල නිරතව සිටින මෙහි 'ඉ' පරිශිෂ්ඨයේ දැක්වෙන තනතුරු හා වැටුප් පරිමාණයන් හිමි පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරීහු මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබති. ඔවුන් සිය පත්වීම් වල ස්ථිර කර තිබිය යුතු අතර, අවුරුදු පහකට නොඅඩු අඛණ්ඩ ස්ථිර සේවා කාලයක් තබිය යුතුවේ.

6.5.2 විභාගයට අයදුම් කළයුතු ආකාරය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මගින් දැනුම් දෙනු ලැබේ.

6.5.3 විභාගය සඳහා අපේක්ෂකයෙකු විසින් ගෙවිය යුතු වන ගාස්තු ප්‍රමාණය අයදුම්පත් කැඳවන නිවේදනයේ සඳහන් කරනු ලබනු ඇත.

6.5.4 සීමිත තරඟ විභාගය සඳහා තුන් වතාවකට වඩා පෙනී සිටීමට කිසිම අපේක්ෂකයෙකුට හිමිකම් නැත.

6.6 එක් ඕනෑම අවස්ථාවකදී තෝරා ගත යුතු නිලධාරීන්ගේ සංඛ්‍යාව මණ්ඩලය විසින් තීරණය කරනු ඇත. එකී ඕනෑම අවස්ථාවකදී තෝරා ගනු ලබන නිලධාරීන් සංඛ්‍යාව II වන පන්තියේ II වන ශ්‍රේණියේ සේවක සංඛ්‍යාවෙහි ඇබෑර්තු සංඛ්‍යාවට වඩා වැඩිවිය යුතු බව අවශ්‍ය වන්නේ යැයි මණ්ඩලයට හැඟෙන්නේ නම්, මණ්ඩලයට එලෙස තීරණය කළ හැකිය. එහෙත් එසේ කළ හැක්කේ එමගින් ක්‍රම සම්පාදන සේවයේ සම්පූර්ණ සේවක සංඛ්‍යාව නොඉක්මවන පරිදිය.

7. විශේෂ අවස්ථාවලදී කෙලින්ම කෙරෙන පත්කිරීම්

7.1 තනතුර සඳහා අවශ්‍ය අදාළ ක්ෂේත්‍රවල විශේෂ දැනුම පුහුණුව පළපුරුද්ද සහිත නිලධාරියෙකු ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය තුලින්ම ලබා ගත නොහැකි විශේෂ අවස්ථාවලදී ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ I වන පන්තියට හෝ II වන පන්තියේ I වන ශ්‍රේණියට හෝ කෙලින්ම පත්වීමක් දීමේ අයිතිය අමාත්‍ය මණ්ඩලය සතුවේ. එසේ තෝරා ගනු ලබන නිලධාරියෙකුට අදාළ පන්තියට හා ශ්‍රේණියට බලපාන්නා වූ පළපුරුද්දට හා සුදුසුකම් වලට වඩා ඉහළ මට්ටමක පළපුරුද්ද හා සුදුසුකම් තිබිය යුතුය. එසේ පත්කිරීමට තෝරා ගනු ලබන තැනැත්තා රාජ්‍ය සේවයේ නිලධාරියෙකුම වන්නේ නම් ඔහු සේවය කරන අමාත්‍යාංශයේ හෝ දෙපාර්තමේන්තුව භාර අමාත්‍යවරයාගේ අදහස් පළමුවෙන් විමසා බැලිය යුතු වන්නේය.

7.1.1 එලෙස කෙලින්ම පත්වීමක් දෙන අවස්ථා වලදී ඒව අදාළ සේවා කොන්දේසි හා නියමයන් රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශයේ හා ජාතික ක්‍රම සම්පාදන විෂය භාර අමාත්‍යාංශයේ අදහස් විමසා මණ්ඩලය විසින් තීරණය කරනු ඇත.

7.1.2. ඉහත 7(1) අනු ඡේදයේ විධිවිධාන යටතේ පත් කරනු ලබන නිලධාරීන්ගේ මුළු සංඛ්‍යාව කිසියම් අවස්ථාවකදී වුව I වන පන්තිය සඳහා අනුමත නිලධාරීන් සංඛ්‍යාවෙන් සියයට විසිපහක් (25%) ද I I පන්තියේ I ශ්‍රේණියට අනුමත නිලධාරීන් සංඛ්‍යාවෙන් සියයට විස්සක් ද (20%) නොඉක්මවිය යුතුය.

8. සේවා කොන්දේසි

8.1 විවෘත තරඟ විභාගයේ ප්‍රතිඵල මත II වන පන්තියේ II වන ශ්‍රේණියට බඳවා ගනු ලබන නිලධාරීහු තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන්නාහ.

8.1.1 විවෘත තරඟ විභාග ප්‍රතිඵල මත II වන පන්තියේ II වන ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරීන් පත් කිරීම් වල ස්ථිර කිරීම අනෙකුත් කරුණු අතර ඔවුන් විසින් 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන්ද නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණ වලින් ද සමත් වීම මත රදා පවතී. අවුරුදු තුනක් (03) අවසානයේදී නිලධාරියෙකු 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සහ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් වී නැත්නම් ඔහුගේ පත්වීම අවසන් කරනු ලැබීමට ඔහු යටත් වන්නේය. සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් සේවයට පිවිසීමට සුදුසුකම් ලැබූ නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස්ය.

8.2. කාර්යක්ෂමතා කඩඉම

8.2.1 විවෘත තරඟ විභාගයේ ප්‍රතිඵල මත සේවයේ II වන පන්තියේ II වන ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරියෙකු රුපියල් 102,900 වැටුප් තලයට එළඹීමට පළමුව 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතු වන්නේය. කාර්යක්ෂමතා කඩඉමෙන් ඔබ්බට උසස් කිරීමට සුදුසුකම් ලැබීම සඳහා ඔහු නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගයකින් සමත් විය යුතුවේ. මෙම විභාගය සම්බන්ධව නිර්දේශ පත්‍රිකාව (ඇ) පරිශිෂ්ඨයේ දැක්වේ.

8.2.2. II වන පන්තියේ II වන ශ්‍රේණියේ නිලධාරීහු රුපියල් 119.100 වැටුප් තලයට එළඹීමට පෙර දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයකින් සමත්විය යුතුය. එම කාර්යක්ෂමතා කඩඉමෙන් ඔබ්බට උසස් කිරීම සඳහා නියමිත විභාගයකින් සමත්විය යුතු වන්නේය. දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා වන නිර්දේශ පත්‍රිකාව (ඇ) පරිශිෂ්ඨයේ දැක්වේ.

8.2.3 II වන පන්තියේ II වන ශ්‍රේණියේ නිලධාරියෙකු වයස අවුරුදු 45 සම්පූර්ණ කිරීමේදී II වන කාර්යක්ෂමතා කඩඉමෙන් ඔබ්බට උසස් කිරීම සඳහා නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

8.2.4 II වන කාර්යක්ෂමතා කඩඉම් විභාග සාමාර්ථයට අතිරේකව නිලධාරියෙකු සිය වැටුප් ක්‍රමයේ උපරිම වැටුප ලැබීමට පෙර ගෙවී යා යුතු කාල සීමාව තුළ ඔහුට පවරනු ලැබිය හැකි රාජකාරී කාර්යක්ෂම ලෙස ඉටු කිරීමට සෑම අතින්ම ඔහු සුදුසු බවට මණ්ඩලය සෑහීමකට පත් වුවහොත් මිස ඔහු වාර්ෂික වැටුප රුපියල් 119.100 ට පෙර ඇති කාර්යක්ෂමතා කඩඉමෙන් ඔබ්බට උසස් කරනු නොලැබේ.

8.2.5 ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ II වන පන්තියේ II වන ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරියෙකු අවුරුදු 06 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට නියමිත පළමුවන හා දෙවන කාර්යක්ෂමතා පරීක්ෂණවලින් හා සංග්‍රහයේ 12 වන ජේදයේ සඳහන් දෙවන භාෂා පරීක්ෂණයෙන් සමත්ව හෝ එයින් නිදහස් කර ඇති විටක ඔහු / ඇය රුපියල් 48,000 ක් (නව වැටුප් තලය 124,500) වූ වැටුප් පියවරේ පිහිටුවනු ලැබේ. මෙම ජේදය ක්‍රියාත්මක වන්නේ 1988 ජූනි 07 වෙනි දින සිටය.

9. නිලධාරීන් ක්‍රම සම්පාදන සේවයට අන්තර්ග්‍රහණය කිරීම.

9.1. ක්‍රම සම්පාදන සේවය ක්‍රියාත්මක වන අමාත්‍යාංශවල ඒකාබද්ධ සේවාවන්ට අයත් නොවන, ක්‍රමසම්පාදන නිලධාරීන්, සහකාර අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ, උපදේශක, අතිරේක අධ්‍යක්ෂ, අධ්‍යක්ෂ යන තනතුරුවල සහ සමාන්තර ශ්‍රේණිවල ස්ථිර පත්වීම් දරණ එමෙන්ම ක්‍රම සම්පාදන කටයුතුවල නියැලී සිටින නිලධාරීන් පහත දැක්වෙන ආකාරයට ක්‍රමසම්පාදන සේවයේ I වන පන්තියට, II වන පන්තියේ I වන ශ්‍රේණියට සහ II වන පන්තියේ II වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරණු ලැබේ.

9.1.1 රුපියල් 72,000-10x3,600-108,000 (වාර්ෂික) වැටුප් ක්‍රමයේ පත්වීම් දරණ ඉහත 9:1 ජේදයේ සඳහන් වර්ග වලට අයත් නිලධාරීහු ක්‍රම සම්පාදන සේවයේ I වන පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලබන්නාහ.

9.1.2 නියමිත දිනයේදී රු. 48,000 - 4 x 1,800 - 7 x 2,400 - 72,000 වාර්ෂික වැටුප් ක්‍රමයේ පත්වීම් දරණ ඉහත 9:1 ජේදයේ සඳහන් වර්ග වලට අයත් නිලධාරීහු ක්‍රම සම්පාදන සේවයේ II වන පන්තියේ I වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලබන්නාහ.

9.1.3. (1) රු. 40,800 - 11 x 1,200 - 54,000 (වාර්ෂික) වැටුප් ක්‍රමයේ පත්වීම් දරණ ඉහත 9:1 ජේදයේ සඳහන් වර්ගවලට අයත් නිලධාරීහු (එවැනි නිලධාරීන්ට ඔවුන් ක්‍රම සම්පාදන සේවයට අන්තර්ග්‍රහණය කිරීමේදී ඔවුනට පෞද්ගලික වන සේ එම වැටුප් ක්‍රමයම තබා ගැනීමට අවසර දෙනු ලැබේ.) සහ

(11) නියමිත දිනයේදී රු. 36,000-15x1,200-54,000 (වාර්ෂික) වැටුප්

ක්‍රමයේ පනවීම් දරණ ඉහත 9:1 ජේදයේ සඳහන් වර්ගවලට අයත් නිලධාරීහුද, (එවැනි නිලධාරීන් ඉහත (1) අනුජේදය යටතේ II වන පන්තියේ II වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන්ට වඩා ජ්‍යෙෂ්ඨත්වයෙන් පහළ වනු ඇත.) ක්‍රම සම්පාදන සේවයේ II වන පන්තියේ II වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලබන්නාහ.

10. ක්‍රම සම්පාදන සේවයට අන්තර්ග්‍රහණය කිරීමේදී වැටුප

10.1 නිලධාරීන් ක්‍රම සම්පාදන සේවයට අන්තර්ග්‍රහණය කිරීමේදී ඔවුන්ට ගෙවිය යුතු වැටුප් ආයතන සංග්‍රහයේ VII වන පරිච්ජේදයේ විධිවිධාන යටතේ නිගමනය කරනු ඇත.

11. ජ්‍යෙෂ්ඨත්වය

11.1. නිලධාරීන් ක්‍රම සම්පාදන සේවයට අන්තර්ග්‍රහණය කිරීමේදී නියමිත දිනදී පැවැති ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨත්වයට හානියක් සිදු නොවනු ඇත.

11.1.1 විවෘත තරඟ විභාගයේ ප්‍රතිඵල අනුව II වන පන්තියේ II වන ශ්‍රේණියට බඳවා ගනු ලබන නිලධාරීන් සේවයේ ස්ථිර කිරීමේදී ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨතාව සාමාන්‍යයෙන් එම විභාගයේ කුසලතා අනුපිළිවෙල අනුව තීරණය කරනු ලැබේ.

11.1.2 සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල අනුව නිලධාරීන් II වන පන්තියේ II වන ශ්‍රේණියට පත් කිරීමේදී ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨතාවය සාමාන්‍යයෙන් ඔවුන් එම විභාගයේදී ලත් කුසලතා අනුපිළිවෙල අනුව තීරණය කරනු ලැබේ.

12. ද්විතීය භාෂාව

12.1 ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ කිසිම නිලධාරියෙකු ද්විතීය භාෂා පරීක්ෂණයකින් සමත් නොවුවහොත් ඉහළ පන්තියකට හෝ ශ්‍රේණියකට හෝ උසස් කරනු ලැබීමට සුදුසු නොවන්නේය.

සටහන (I) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා "ආදි ප්‍රවේශකයන්" වශයෙන් සැලකෙන නිලධාරීන් සඳහා සිංහල නිලධාරීන් සම්බන්ධයෙන් ද්විතීය භාෂාව වන්නේ ද්‍රවිඩ භාෂාවය. ද්‍රවිඩ නිලධාරීන් සම්බන්ධයෙන් සිංහල භාෂාවය.

(II) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා "නව ප්‍රවේශකයන්" ලෙස සැලකෙන නිලධාරීන් සඳහා ද්විතීය භාෂාව පහත සඳහන් පරිදිය.

(i) සිංහල මාධ්‍යයෙන් සේවයට පිවිසීමට සුදුසුකම් ලැබූ අයට දෙමළ හෝ ඉංග්‍රීසිය

(ii) දෙමළ මාධ්‍යයෙන් සේවයට පිවිසීමට සුදුසුකම් ලැබූ අයට සිංහල හෝ ඉංග්‍රීසිය.

(iii) ඉංග්‍රීසි මාධ්‍යයෙන් සේවයට පිවිසීමට සුදුසුකම් ලැබූ අයට සිංහල හෝ දෙමළය.

(iv) දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් සේවයට පිවිසීමට සුදුසුකම් ලැබූ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථය සඳහා "නව ප්‍රවේශකයන්" ලෙස සැලකෙනු නිලධාරීන් 1966 සැප්තැම්බර් 04 වන දින අංක 701 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ නියමිත III වන ශ්‍රේණියේ සිංහල ප්‍රවීණතා පරීක්ෂණය සමත් වී සිටී නම්, ඔවුන් ද්විතීය භාෂාවකින් සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

(v) ඉහත (I) හා (II) ජේදයන් යටතේ සේවයට පිවිසීමට සුදුසුකම් ලැබූ අය මෙහි "ඇ" පරිශිෂ්ඨයේ සඳහන් පළමුවන කාර්යක්ෂමතා කඩඉමේ ඉංග්‍රීසි භාෂා විෂයට පෙනී සිට සමත් වුවහොත් ද්විතීය භාෂාව සමත් වීමේ අවශ්‍ය තාවයෙන් නිදහස් කරනු ලැබේ.

(III) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා "ආදි ප්‍රවේශකයන්" ලෙස සැලකෙන සිංහල නිලධාරීන් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය මට්ටමේ සිංහල විභාගයකින් සමත් වී සිටී නම්, ඔවුන් ද්විතීය භාෂා පරීක්ෂණයකින් (එනම් දෙමළ) සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

13. මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන සැලසී නොමැති යම් කරුණක් වෙතොත්, ඒ මණ්ඩලය විසින් තීරණය කරනු ඇත.

## "අ" පරිශිෂ්ඨය

**ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය පිළිබඳ විස්තරාවලිය.**

(I) විභාග පරිපාටිය සහ විෂයය නිර්දේශයන් - මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ.

"අ" කොටස

(I) අවබෝධය
(II) බුද්ධි පරීක්ෂණය
(III) සාමාන්‍ය සම්ප්‍රජානනය

"ආ" කොටස

(I) සම්මුඛ පරීක්ෂණය (මේ සඳහා ලකුණු නොලැබේ.)

විභාගයේ "ආ" කොටස පවත්වනු ලබන්නේ "අ" කොටසෙහි ප්‍රතිඵල දැනගන්නට ලැබුණ පසුවය. "අ" කොටසින් සුදුසුකම් ලබන අපේක්ෂකයින්ට "ආ" කොටස සඳහා දිනය දන්වනු ලැබේ.

(2) විභාග පරිපාටිය - විභාග මාධ්‍යය

(අ) මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පැවැත්වේ.

(ආ අපේක්ෂකයෙක් කැමති භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකිය.

**සටහන**

(I) අපේක්ෂකයෙක් මෙම විභාගයේ සියළුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ එක් භාෂාවකින් පමණි.

(II) අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

(3) **පරීක්ෂණ ක්‍රමය**

**"අ" කොටස**

(I) අවබෝධය : ලකුණු 100 පැය දෙකක ප්‍රශ්න පත්‍රයකි.

(II) බුද්ධි පරීක්ෂණය : ලකුණු 100 පැය එකක ප්‍රශ්න පත්‍රයකි.

(III) සාමාන්‍ය සම්ප්‍රජානනය : ලකුණු 100 පැය දෙකක ප්‍රශ්ණ පත්‍රයකි.

**"ආ" කොටස**

(I) වාචික පරීක්ෂණය : ලකුණු දෙනු නොලැබේ. - සෑම ලිඛිත ප්‍රශ්ණ පත්‍රයක් සඳහාම නියමිත ලකුණු වලින් යටත් පිරිසෙයින් 40% ක් වත් ලබා නොගන්නා අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබීමට නුසුදුසු වනු ඇත.

(4) පත් කරනු ලැබීම සඳහා තෝරා ගැනීමේ ක්‍රමය : පත් කරනු ලැබීම සඳහා අපේක්ෂකයින් තෝරා ගනු ලබන්නේ විභාගයේ ඉහළම ලකුණු ලබා ඇති අයවලුන් අතරිනි. අපේක්ෂකයින් කිප දෙනෙක් සම සමව එක් ස්ථානයක් හිමි කර ගෙන ඇති අවස්ථාවකදී එම ස්ථානය සඳහා තෝරා ගනු ලබන්නේ ක්‍රමසම්පාදන සේවා මණ්ඩලය විසිනි.

(5) විෂය නිර්දේශයන් - විෂයය අංකය 01 - අවබෝධය. මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ. I වැනි කොටසට රචනයක් සහ සාරංශයක් ලිවීම ඇතුලත් වේ. භාෂාව පිළිබඳ අපේක්ෂකයාගේ වැටහිම පරීක්ෂා කිරීම පිණිස සැකසුනු පාඨයන් කිහිපයකින් II වැනි කොටස සමන්විත වේ. මෙම පාඨයන් ආශ්‍රයෙන් යටින් ඉරි ගැසූ පදයන්ගෙන් අර්ථය නනි වාක්‍යයකින් ප්‍රකාශ කරන ලෙස හෝ ඒ පිළිබඳ විවරණාත්මක සටහන් ලියා දක්වන ලෙස හෝ විකල්පයන් කාණ්ඩයකින් ඉතාමත්ම උචිත ප්‍රකාශය තෝරා දක්වන ලෙස හෝ දී ඇති ප්‍රශ්නය සඳහා උත්තර කිහිපයක් අතරින් නිවැරදි උත්තර තෝරා දක්වන ලෙස අපේක්ෂකයින්ට නියම කරනු ලැබේ. එක් එක් කොටස සඳහා සමාන ලකුණු හිමිවේ. ප්‍රශ්න පත්තරය පැය දෙකකට සීමා වේ.

**විෂයය අංකය - 02 බුද්ධි පරීක්ෂණය** - මෙම ප්‍රශ්න පත්‍රය පැය 1 කට සීමා වේ. අපේක්ෂකයාගේ තර්කානුකූල විවරණ සහ විග්‍රහ ශක්තිය සහ නිවැරදිව සිද්ධි අනුමානයන්ට එළඹීමේ හැකියාව පිළිබඳව මැනීමක් කිරීම අරමුණු කොට ගෙන මෙය සම්පාදනය කරනු ලැබේ. මෙය බහුවර්ණ ප්‍රශ්න පත්‍රයකි.

**විෂයය අංක - 03 සාමාන්‍ය සම්ප්‍රජානනය ප්‍රශ්න පත්‍රය** - මෙම ප්‍රශ්න පත්‍රය පැය 02 කට සීමාවේ. මෙම ප්‍රශ්න පත්‍රය සම්පාදනය කරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ භූගෝලීය, දේශපාලනීය, ආර්ථික සාමාජයීය සහ සංස්කෘතික පරිසරය ඇතුළු අපේක්ෂකයා ජීවත් වන මූළ පරිසරය පිළිබඳව ද ජාතික සහ අන්තර් ජාතික වශයෙන් වැදගත් වන්නාවූ කාලීන කරුණු මෙන්ම විද්‍යාත්මක සහ තාක්ෂණ වර්ධනයන් පිළිබඳව ද ඔහු තුළ ඇති සම්ප්‍රජානනය පිරික්සීම සඳහාය.

6. සම්මුඛ පරීක්ෂණය - එක් එක් අපේක්ෂකයා සම්මුඛ පරීක්ෂනයට භාජනය කරනු ලබන්නේ ක්‍රම සම්පාදන සේවා මන්ඩලය විසින් පත්කරනු ලබන රාජ්‍ය නිලධාරීන් පස් දෙනෙකුගෙන් සැදුම්ලත් මණ්ඩලයක් විසිනි.

## 'ආ' පරිශිෂ්ඨය

## ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයට පත් කිරීම සඳහා වන සීමිත තරඟ විභාගය පිළිබඳ විස්තරාවලිය

(1) විභාග පරිපාටිය සහ විෂය නිර්දේශයන් - මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර වලින් සමන්විත වේ.

**(අ) කොටස**

(i) අවබෝධය ලකුණු 100 පැය 02 ප්‍රශ්ණ පත්‍රයකි.

(ii) විෂයානුබද්ධ අධ්‍යයනය ලකුණු 100 පැය 01 ප්‍රශ්න පත්‍රයකි.

(iii) ක්‍රම සම්පාදනය සහ ව්‍යාපෘති ඇගයීම ලකුණු 100 පැය 02 ප්‍රශ්න පත්‍රයකි.

**(ආ) කොටස**

(i) සම්මුඛ පරීක්ෂණය - මේ සඳහා ලකුණු දෙනු නොලැබේ.

(2) (අ) විෂයය නිර්දේශයන් -- විෂය අංක 1- අවබෝධය - පාඨ කාණ්ඩය අපේක්ෂකයා හමුවේ තබනු ලැබේ. මින් ඇතැම් පාඨයන් ආශ්‍රයෙන් අපේක්ෂකයා වෙත විකල්ප ප්‍රකාශයන් කාණ්ඩයක් ඉදිරිපත් කරනු ලැබේ. ඉන් එකක් එම පාඨයේ අන්තර්ගත කරුණු වලට වඩාත් හොඳින්ම ගැලපෙනු ඇත. ඉතාමත්ම උචිත පාඨය තෝරා දක්වන ලෙස අපේක්ෂකයාට නියම කරනු ලැබේ. අතිකුත් පාඨයන් අලලා ප්‍රශ්න පිළියෙල කරනු ලබන්නේ අපේක්ෂකයා එම පාඨවල අර්ථය වටහා ගන්නා අන්දම පරීක්ෂා කිරීම සඳහාය.

**විෂයය අංකය 2 - විෂයානුබද්ධ අධ්‍යයනය** - අපේක්ෂකයා සතු නිර්මාණාත්මකව සිතීමේ ශක්තීන් සහ ගැටළු නිරාකරණය කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම අරමුණු කොට ගෙන සම්පාදිත ප්‍රශ්න පත්‍රයකි. මෙම ප්‍රශ්න පත්‍රයට වර්තමාන ශ්‍රී ලංකාවේ ආර්ථික හා ක්‍රම සම්පාදනය සම්බන්ධ තොරතුරු

(ii) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ව්‍යාපෘති සහ වැඩසටහන් නිසියාකාරව සහ කාලීනව ක්‍රියාත්මක කිරීම, සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලසුම් හා ක්‍රියාත්මක කිරීමේ උපාල්මන සැකසීම, විපරම සහ ප්‍රගති පාලනය සම්බන්ධීකරණය සහ ඉදිරි කටයුතු.

(iii) ව්‍යාපෘති ඇගයීම, ව්‍යාපෘතිවල සහ වැඩ සටහන්වල සඵලතාය තක්සේරු කිරීම, පිරිවැය සාපේක්ෂව ප්‍රතිලාභ විශ්ලේෂණය.

## 'ඇ' පරිශිෂ්ටය

### ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ ii වන පංතියේ ii වන ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරීන් සඳහා ii වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ නිර්දේශ පත්‍රය

නිලධාරියෙකු අනුමත විශ්ව විද්‍යාලයකින් හෝ උසස් අධ්‍යාපන ආයතනයකින් පහත සඳහන් විෂයයන්ගෙන් කවර එකකට හෝ අදාළ විශේෂ ක්ෂේත්‍රයකින් හෝ පශ්චාත් උපාධියක් / ඩිප්ලෝමාවක් ලබාගත් විට, ඔහු දෙවන කාර්යක්ෂමතා කඩඉම අවශ්‍යතාවය සපුරා ඇතැයි සලකනු ලැබේ. මෙම පශ්චාත් උපාධියට / ඩිප්ලෝමාවට එක් වර්ෂයක අධ්‍යයන කටයුතු ඇතුළත් විය යුතුවේ.

(අ) ආර්ථික විද්‍යාව
(ආ) වාණිජ්‍යය
(ඇ) සමාජ විද්‍යාව
(ඈ) සංඛ්‍යානය
(ඉ) කෘෂිකර්මය
(ඊ) කළමණාකරණය
(උ) ක්‍රම විශ්ලේෂණය (පරිගණක වැඩසටහන් සම්පාදනය)
(ඌ) මණ්ඩලය විසින් අනුමත කෙරෙන වෙනත් විෂයයන්

06 – 332

## 'ඉ' පරිශිෂ්ටය

### ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයට බඳවා ගැනීමේ සීමිත තරග විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබන සේවාවන් හා වැටුප් පරිමාණයන්

| සේවාව | වැටුප් පරිමාණය |
|---|---|
| I. සැලසුම් ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන් ... | රු. 28,800-1x600-11x 900- රු.39,300 |
| II. සංවර්ධන නිලධාරීන් ... | රු. 27,000-4x600-11x900- රු 39,300 |
| III. සංඛ්‍යා ලේඛණ සහකාරවරුන් ... (මුදල් හා ජාතික ක්‍රම සම්පාදන විෂය භාර අමාත්‍යාංශය) | රු.27,000-4x600-11x900- රු. 39,300 |
| IV. ව්‍යවසායකත්ව සංවර්ධන ප්‍රමුණු නිලධාරීන් (යොවුන් කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය) ... | රු. 25,200-7x600-10x900-3x1,200-රු. 42,000 |
| V. ව්‍යාපෘති නිලධාරී (සැ/ක්‍රි/පා/ස. අමාත්‍යාංශය) ... | රු. 79,080-12x2,460-108,600 |
| VI. සංවර්ධන සහකාර (සැ/ක්‍රි/පා/ස. අමාත්‍යාංශය) ... | රු. 74,160-13x1, 560-5x2, 460 106,740 |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව